සියලුම හිමිකම් ඇවිරිණි / All Right Recerved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 13 ශ්‍රේණිය.
පළමු වාර පරීක්ෂණය - 2018 - නොවැම්බර්
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 நவம்பர், தரம் 13 முதலாம் தவணைப் பரீட்சை
General Certificate of Education (Adv. Level) Grade 13 First Term Test 2018 November

| | | |
|---|---|---|
| සිංහල - I<br>Sinhala - I | 71 S I . | කාලය පැය තුනයි<br>03 hours |

උපදෙස් :
- ❖ පළමුවැනි ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.
- ❖ පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.

● පහත දක්වෙන උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(I) (අ) එවේලාවට මට්ටකුණ්ඩලී හිත්තිය දිසාවට මුණ ලා වැද හොත්තේ ය. බුදුහු තමන් වහන්සේ නො දන්නා නියාව දුත ශරීරප්‍රදේශයකින් රශ්මියක් විහිදුවා වදාළ සේක. ඒ රස් කද ගොසින් ඛිනන වැද ගත. මට්ටකුණ්ඩලීත් බුදු රජ දුත මියන වේලක රුවන් පත්මිත ඉතිපෙත්තක් ගෙන ගොස් පිටුවාලා පෙන්ත දසාවට තමා ශූ කලක් මෙත් මිදුල දසාවට නැමී ලා වැදහොත් නැතැත්තෝ දෙතිසක් විතර මහාපුරුෂලක්ෂණයෙන් හා අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් හා ව්‍යාමප්‍රභා තේතුමාලායෙන් හා දසදිග පතළ සවනත් බුදු රසින් හා තප් ගිනි ගත් රුවන් මෙරක් මෙන් බබළවමින් වැඩ සිටි බැලු බැලුවන් ඇස් පනහන සිතූ සිතුවන් සිත් පනහන ඇසූ ඇසුවන් කන් පනහන අනල්ප කල්ප කෝටිශතසහස්‍රයෙහි පිරූ පුවරිතය එක් කොට තබා පිටුවා ලූවාක් වැනි බුදුරුව දැක නුවණ නැති පියාණන්ගේ සම්වාය නපුරු හෙයින් බුදුන් කරා ගොස් වැද පියන්නට වේව යි දනක් දී පියන්නට වේව යි බණක් අසා පියන්නට වේව යි මේ සොළොස් හවුරුද්දෙහි අට හවුරුද්දක් විතර නොවී ය.

(i) බුදුන් වහන්සේ තමා වැඩ සිටින බව මට්ටකුණ්ඩලීට පෙනෙන්නට සැලැස්වූයේ කෙසේ ද?

(ii) මට්ටකුණ්ඩලීට පියාගේ ආශ්‍රය නපුරු වූයේ ඇයි?

(iii) ඡේදයේ ඇති උපමාවක් හා උපමේයක් වෙන්කර ලියන්න.

(iv) "අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් හා ව්‍යාම ප්‍රභා තේතුමාලායෙන්" යන්නෙහි අර්ථය ලියන්න. (ලකුණු 04යි)

(ආ) තව ද මේ අනුරුද්ධ කුමාරයෝ ය, භද්දිය කුමාරයෝ ය, කිම්බිල කුමාරයෝ ය යන මේ රජකුමරුවෝ තුන්දෙන පසළොස්, සොළොස් හැවිරිදි අවස්ථාවෙහි මවුපියොවුන් හා සමග කෙළකෙළ හිඳ "බත් උපදින්නේ කොයින් දැ"යි සැක කළ හ. එයින් කිම්බිල කුමාරයෝ එක් දවසෙක කෙළ ගෙන යන්නාවූ බවසලින් වී බානා දැක ඒ සලකුණෙන් "බත් උපදින්නේ බවසලිනැ" කීහ. භද්දිය කුමාරයෝ දවසෙක සැළියෙන් බත් රන් තලියේ ලන්නා දැක ඒ සලකුණෙන් "බත් උපදින්නේ බවසලින් නොවැ සැළියෙනැ" යි කීය. අනුරුද්ධ කුමාරයෝ තොටුවෙන් වී බානාත් නුදුටු විරූ හ. සැළියෙන් බත් ගන්නාක් නුදුටු විරූ හ. ඉදිරියෙහි තන්ට තබා ලූ බත් ම දුටු විරූ හ. "උපේ තෙයින් තොප දෙන්නා ම කියන්නේ නොදැන ය. බත් උපදිනා තැන් මම දනිමි; වටුරියක් උස තැතුළ ඇති මහරන්තලියකින් බත් උපදින්නේ ය." යි කීහ. මෙසේ එම පින් බලයෙන් බත් උපදිනා තැනුත් නොදැන ගිහිගෙයි සුඛිත ව වාසය කෙරෙති.

(i) කුමාරවරු තිදෙනාගේ සිත්වල ඇති වූ සැකය කුමක් ද?

(ii) කිම්බිල කුමාරයා දැක් වූ අදහස පැහැදිලි කරන්න.

(iii) "මහරන්තලියකින් බත් උපදින්නේ ය" යි ප්‍රකාශ කළේ කවුද?

(iv) **බවසලින්** හා **වටුරියක්** යන පදවල අර්ථ ලියන්න.

(ලකුණු 04යි)

(ඉ) එදවස මිසවුන් ප්‍රධාන කොට සතළිස් දහසක් පමණ නාටකාංගනාවෝ වෙසෙති. සතළිස් දහසක් නාටකස්ත්‍රීන් කෙරෙන් සුදු උභය පාරිශුද්ධ ක්ෂත්‍රිය කන්‍යාවෝ ම එක්දහස් අනූවක් දෙන ය. බිම්බා දේවී ද බුදුන් තමන්ගේ භවනයට වඩනා නියාව අසා, ඒ ක්ෂත්‍රිය කන්‍යාවන් හැම දෙනා ම සදාය වස්ත්‍රයක් හැඳ පෙරව අව මැනැවැ යි විධාන කළහ. උයින් එලෙස ම අවුත් පිරිවරා සිටියහ. බුදුහු වැඩ වදාරා පනවන ලද අස්න මස්තකයෙහි පලක් බැඳ වැඩ උන් සේක. ඉක්බිති හැමදෙනා ම එක පැහැර බුදුන් පාමුල් හි අඩා හුන් හ. බිම්බා දේවීන් වහන්සේ ද බුදුන්ගේ ශ්‍රී පාදයෙහි ජංඝාපරියන්තය කරපේ අල්වා නඩා වැලපෙ සේක සන්හිඳුවා මයිල් රජ්ජුරුවන් කෙරෙහි මහත් වූ ආදර බහුමානයෙන් එකත් පසෙක උන් සේක.

(i) බිම්බා දේවිය කන්‍යාවන්ට කළ විධානය කුමක් ද?

(ii) ආදරබහුමානයෙන් ගෞරව කළේ කාටද?

(iii) බුදුන් දුටු කෙණෙහි බිම්බාදේවිය ඇතුළු කන්‍යාවන් කළේ කුමක් ද?

(iv) උභය පාරිශුද්ධ හා ජංඝාපරියන්තය යන පදවල අර්ථය ලියන්න.

(ලකුණු 04යි)

(ඊ)
ප පු ස ර රුසිරෙන් පුර හා
ගොස ස ර රන්මිණි සල හා
එතුවර කෙළි රඟ පුර හා
ඔබිසර සිත වත් කල හා

පැහැර රඟන සුරන් රඟා
එපුර පියලු දන ස රඟා
කිහර කෙළිකි සිතසෙ රඟා
සවර සලෙන වේද ඒ රඟා

(ලකුණු 04යි)

(i) මේ තුවර ලියන් රංගනය කළේ කවුරුන් ලෙස ද?

(ii) සිත් වූ පරිද්දෙන් රංගනය කරන්නේ කවුද?

(iii) තැළුණු සිතක් ඇති වූයේ කාට ද?

(iv) ක්‍රීඩා හා දෙවියන් යන වචනවලට සමාන පද කවියෙන් උපුටා ලියන්න.

(ලකුණු 04යි)

(උ) පහත සඳහන් උද්ධෘත ඇසුරින් සන්දර්භ අවස්ථා සම්බන්ධය ලියන්න.

(i) "ඉතින් කොහොම ද දුව ! අම්මා එන වෙලාවට ද හැමදාම දුවත් එන්නේ ?"

(ii) "සත් රුවනින් සත් සගලක් කරවා දෙමි"

(iii) "ඇදුරකු සම වෙතට
ගෙනෙන ලෙස පැවසූ ය එකෙකුට"

(iv) "නෑ මම තීකම් හිතුනාවා හොඳහ විස්තුජ්ජාරියක් වෙලා සර් හේද සල්ලාකාරයෙක් වෙන්න තිබුණේ කියලා"

(v) "සබඳ චන්ද්‍රිකාව, මට සමාවෙන්න මම මාගේ ජීවිතය අනූ අසි ව තිබිය දී සන්තති විච්ඡේදයෙන් තැපෙමි යි"

(vi) "අනේ මහත්තයෝ, මම කොහොම ගෙනියන්න ද මහත්තයෝ,...... මහත්තයාලා කරන දෙයක් බලාගෙන ඉන්නාව මිසක්"

(ලකුණු 06යි)

(ආ) පහත දැක්වෙන කවිපෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

දුදනො' ද                    මිදු
ලද සොඳ                    සඳු
සඳ දෙව්                    රදු
                              සාමිනේ

මගෙ කුකුළා හැදූ        එකා
දදය එබිගෙ සැරි         යකා
තව එක මුදු දිනත්       සකා
ඉත්තට අඩි තොදී         මිකා

මලා                         එල්ල
හෙළව                       හෙල්ල
මුළැ මැ                     මෙල්ල
                              මරු හැනේ

සතරගමට  රැඳුණු  රජේ
සිගා  කුසා  ලමහ  විජේ
පයින් මැ හොස් ඇවිදැ වජේ
පොළොවැ උලා තළප් ඇමේ

දිගට                        ඇදී
හැකා                        පැහැදී
මහ හඩ                     දී
                              දෙවියනේ

රනින් කුකුළු රුවක්        පුදමි
රිදියෙන් සිදුවටක්         පුදමි
රන් දුනු හී දෙකක්         පුදමි
රුවට රිදී රුවක්          පුදමි

'සතර                        ගමේ
මිල                          මහිමේ
සුදු ද                      එ - මේ'
                              හැම සැනේ

සියමින් තබ'කුරු         මමනේ
මොළඳුන්ගෙ ද සිරි       කුඩනේ
රඟ දෙන්නට වඩම්        අනේ
එහ' සිත් සිම් සදින      මගේ

දුදනො' ද                    මිදු
ලද සොඳ                    සඳු
සඳ දෙව්                    රදු
                              සාමිනේ

මට සල මෙ - විසන        අනේ
මිලා ගන්නැ           දෙවියනේ
වැජැඹෙන තා  මෙ - විමනේ
මලන්නැ තා            සාමිනේ

(ලකුණු 16යි)

(02) මිනිස් සන්තානගත කාරුණ්‍ය සදය උපහාසයෙන් යුතු ව නිර්මාණය කිරීම තුළින් දුගී ජනයාට උතුම් පණිවිඩයක් දීමට ධර්මසේන හිමියන් සමත් වී ඇත. මේ පිළිබඳ ව **මට්ටකුණ්ඩලී වස්තුවෙන්** උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

බමුණු සමාජයේ පහත් තත්ත්වයෙන් සැලකූ ස්ත්‍රියගේ පතිභක්තියේ උදාරත්වය සර්වකාලීන වටිනාකමකින් යුක්ත ව ඉදිරිපත් කිරීමට ජාතක කතාකරුවා ගත් උත්සාහය **චන්දකින්නර ජාතකය** ඇසුරෙන් විමසන්න. (ලකුණු 15යි)

(03) පොදු සමාජ ආර්ථික මට්ටමක කෙනෙකු වුවත් පරිසරය සමග ජීවත් විය යුතු ය යන පණිවිඩය සමාජගත කිරීමට පූජාවලියේ කතුවරයා සමත් වී ඇත්තේ කෙසේ දැ යි **අනුරුද්ධ කුමාර වස්තුව** ඇසුරින් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.
(ලකුණු 15යි)

(04) යටත් විජිතවාදී පාලන යුගයේ දී ලංකාවේ ඈත පිටිසර පළාත්වල ජනතාවට මුහුණ දීමට සිදු වූ අහිතකර බලපෑම **බැද්දේගම නවකතාව** ඇසුරෙන් විමසන්න.
(ලකුණු 15යි)

(05) පිංකම් කිරීමේ දී මිනිස් සිතේ ඇති චේතනාව ජීවිතයම වෙනස් කිරීමට හේතු වන බව **ස්වර්ණතිලකා කතාව** ඇසුරෙන් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.
(ලකුණු 15යි)

(06) මධ්‍යම පාන්තික සමාජයේ හරසුන් බව **'අතුරට යන වෙලාවේ'** කෙටිකතාවෙන් නිරූපණය කෙරේ. විමසන්න.
(ලකුණු 15යි)

(07) කොළඹ කවියේ දෙවන තරංගයේ කවීන්ගේ කාව්‍ය නිර්මාණවලට වස්තු විෂය වූ අත්දැකීම්වල විශේෂත්වය නියමිත පද්‍ය පන්ති **දෙකක්** ඇසුරෙන් විමසන්න.
(ලකුණු 15යි)

(08) චමත්කාර වූ පැණකෙළියක අසිරිය පාඨක මනසේ නිදන්ගත කිරීමට වැත්තෑවේ හිමියන් සමත් වූ ආකාරය **ගුත්තිල කාව්‍යය** ඇසුරෙන් උදාහරණ දක්වමින් විමසන්න.
(ලකුණු 15යි)

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 13 ශ්‍රේණිය.
පළමු වාර පරීක්ෂණය - 2018 - නොවැම්බර්
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 நிலை, தரம் 13 முதலாம் தவணைப் பரீட்சை
General Certificate of Education (Adv. Level) Grade 13 First Term Test 2018 November

| සිංහල - II<br>Sinhala - II | 71 S II | කාලය පැය තුනයි<br>03 hours |
|---|---|---|

❖ උපදෙස්
❖ I කොටසේ 1 ප්‍රශ්නය ද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
❖ 1 ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට **මෙම ප්‍රශ්න පත්‍රයේ** ම පිළිතුරු සපයන්න.
❖ I කොටස, II කොටසේ පිළිතුරු පත් සමග **අමුණා භාර දෙන්න.**

## I කොටස

01. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. **ඝෝෂ මහප්‍රාණාක්ෂර** පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ග, ජ, ඩ, ද, බ (2) ක, ච, ට, ත, ප
(3) ඝ, ඣ, ඪ, ධ, භ (4) ඛ, ඡ, ඨ, ථ, ඵ
(5) ඞ, ඤ, ණ, න, ම (..............)

1.2. **නිවැරදි අක්ෂර වින්‍යාසය** සහිත පද පේළිය තෝරන්න.
(1) විරෝදාර, ආපන ශාලාව, සාමර්ථ්‍යය, නව පුවළ, කලමනාකරණය
(2) විරෝධාර, ආපණ ශාලාව, සාමර්ථ්‍යය, නව පුවළ, කළමණාකරණය
(3) වීරෝදාර, ආපණ ශාලාව, සාමර්ථය, නව පුවළ, කලමනාකරණය
(4) වීරෝධාර, ආපන ශාලාව, සාමර්ථ්‍යය, නව පුවල, කළමනාකරණය
(5) වීරෝදාර, ආපණ ශාලාව, සාමර්ථ්‍යය, නව පුවළ, කළමනාකරණය (..............)

1.3. **අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව** ලියා ඇති පද පේළිය තෝරන්න.
(1) කොමඩු, දොඩම්, පියබලා, හිඹුටු (2) පේර, දෙහි, දෙළුම්, අඹ
(3) ආනමාලු, රත්කෙසෙල්, පුවාලු, සුවඳැල් (4) දිවුල්, බෙලි, කිරල, නාබරංකා
(5) හිඹුටු, ලොවි, උගුරැස්ස, රඹුටන් (..............)

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **නිවැරදි ප්‍රකාශය** තෝරන්න.
(1) 'ය' යන්න සමග යංශය නොයෙදේ.
(2) 'ය' යන්නට පසුව යංශය යෙදෙන විට 'රේඵය' යංශයට ඉහළින් යෙදේ.
(3) යංශය යෙදෙනුයේ ස්වරයක් සමග පමණයි.
(4) 'ර' යන්නත් සමග යංශය යෙදේ.
(5) 'ය' යන්නත් සමග යංශය යෙදෙන විට 'රේඵය' 'ය' යන්නට ඉහළින් යෙදේ. (..............)

1.5. **ගයනුකිත්ත, රකාරාංශය, ඇලපිල්ල හා කෙටි පාපිල්ල සහිත වචන අනුපිළිවෙළින්** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ශ්‍රවණය, රුක, වානර, ලෞකික (2) සුදන, පාපල, භෞතික, ක්‍රමය
(3) ප්‍රබල, චෞර, තාලය, මුදල (4) බෞද්ධ, භ්‍රමණය, සාගරය, රුවල
(5) ගෞරවය, දක්ෂතාව, ශ්‍රමය, නුවණ (..............)

1.6. එකිනෙකට **අනුරූප වන සේ වචන යුගල යෙදී** ඇති වරණය තෝරන්න.
(1) සරා සඳ, වියරණ ග්‍රන්ථය, සමන් බඹුරු, උපදෙස් වැකිය
(2) ප්‍රසන්න චිත්තය, අභිමාන සිත, අටලෝ දහම, අවිදු අන්ධකාරය
(3) කුළුණු සිත, සාගර ජලය, සාරභූමිය, අදිසුරු මඬුල්ල
(4) කලයාණී ගඟ, ගන අඳුර, අවමඟුල් උත්සවය, සුද සේනාව
(5) රණහල, පොපුරු පෙම, ජර්ර අදිටන, කනිෂ්ඨ විදුහල (..............)

1.7. **තත්සම වචන පමණක්** යෙදී ඇති වරණය කුමක් ද?
(1) ප්‍රවෘත්ති, මිහිතන, මව්බස, ශෛලමය
(2) කල්‍යාණ, රථාචාර්ය, මාතෘ, මෞඪ
(3) සිළුමිණ, මධ්‍යම, හස්ත, වැස්ස
(4) රාවය, සිපුම්, ස්වර්ණ, අරුත්
(5) චන්දන, අධ්‍යාශය, මිනිස්, ව්‍යාකරණ (..............)

1.8. මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) තරුණ - වෘද්ධ, මහලු, යෞවන, වැඩිහිටි
(2) ආලෝක - අන්ධකාරය, තිමිර, අඳුර, කළුවර
(3) ශාන්ත - චණ්ඩ, රෞද්‍ර, කුරිරු, රළු
(4) ප්‍රබුද්ධ - අප්‍රබුද්ධ, අල්පඥාන, අඥාන, මෝඩ
(5) අසංවර - සංවර, සංයත, දැමුණු, දාන්ත (..............)

1.9. මුලින් දී ඇති පදයට **සමානාර්ථ පදයක් ඇතුළත් නොවන** වරණය තෝරන්න.
(1) ආපදාව - විපත, ව්‍යසනය, අනර්ථය, විපත්තිය
(2) උන්නතිය - දියුණුව, ප්‍රගතිය, අභිවෘද්ධිය, අභ්‍යුදය
(3) පියුම - අම්බුජ, පංකජ, කෙවෙවන්දි, තාමරසි
(4) මුහුද - රුවනාර, අර්ණවය, සිඳු, සමුදුර
(5) නිරතුරු - නිතර, නිබඳ, සතත, අනවරතයෙන් (..............)

1.10. **විභක්ති, දකාරාර්ථ විශේෂණ, අනුකාර්ථ, සමාස පද පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(1) පින්පඩ, කම්කරු, ලොකුඅම්මා, පහපැස්
(2) රත්රුවන්, මලවී, වනමල්, ජේනකපථ
(3) දියබත්, පියපත්, පොත්පත්, දයකුඵල්
(4) රන්කෙතෙල්, ගන්කරු, මව්පිය, දසබල
(5) මුදුළුණු, කුරුලිය, තිලුපුල්, කුසුම්සරා (..............)

1.11. **තද්ධිතයක් නොවන පදයක්** අන්තර්ගත වරණය තෝරන්න.
(1) රුමත්, කවිති, සුහදතා, ගුරුවරු
(2) ධෛර්යවන්ත, ප්‍රාදේශික, අද්‍යතන, ලෞකික
(3) මිහිරිතම, බලවත්, පෙම්වත්, කුල්මත්
(4) විශේෂඥ, විශිෂ්ටතම, කලාකාමී, නෛපුණ්‍ය
(5) විනෝදකාමී, ආසියානු, උදාරත්ව, කාලීන (..............)

1.12. පහත සඳහන් උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් **ක්‍රියා වර්ගය පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(අ) **කියමින්** පොද සී සින්දු
(ආ) පඩි පෙළින් **බැස** අයින් වී එන්න.
(ඉ) හිරු **නැඟෙන** නෙරුම් පිපේ.
(ඊ) මම **යන්න** එවිනේ සොයා ගෙන සොයා ගෙන

(1) විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(2) අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා
(3) අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා
(4) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා
(5) විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා (..............)

1.13. **උක්ත පද දෙකක්** හා **අනුක්ත පද දෙකක්** අන්තර්ගත වරණය තෝරන්න.

(1) මිනිසෙක්, ලිපිකාරිනියක්, වෛද්‍යවරයෙක්, ඉංජිනේරුවෙකු

(2) මව්හු, ප්‍රේක්ෂකයෙකු, අසන්නෙකු, දෙමව්පියෝ

(3) උගතෙක්, නැණවතෙක්, දානපතියෙක්, ධනවතෙක්

(4) ශිෂ්‍යාවක, මෙහෙයක, කිරිල්ලියක, ගුරුවරියක

(5) නිළියක්, සහෘදයෙක්, විද්වතෙක්, ගායකයෙක් (...............)

1.14. **උපසර්ගයක් යෙදී නැති** පදයක් සහිත පද පෙළිය තෝරන්න.

(1) පරිසමාප්ත, අභිරූපණ, සංවර්ධනය, විහර

(2) අනුගමනය, අවමානය, සංකල්පනා, පිළිරූ

(3) පවර, සපිරි, විරචිත, අපරණ

(4) ඉම්හිරි, නිරෝගී, පරිපූර්ණ, ව්‍යුත්ත

(5) පරාජය, සුමිළිනන්, අව්‍යක්ත, අභ්‍යුදය (...............)

1.15. "අනුපිළිවෙළින් ලංකාවේ රාජධානි බවට පත් වූ **පුරප්‍රවරයන්ගේ** නම් අනුව සිංහල සාහිත්‍යය ද **සම්ප්‍රදායානුකූල** ව **ඓතිහාසික** යුගවලට බෙදේ."

යන්තෙහි එවන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළ අකුරෙන් මුද්‍රිත පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) තද්ධිත, සන්ධි, සමාස පදවලට ය.

(2) සන්ධි, සමාස, තද්ධිත පදවලට ය.

(3) තද්ධිත, සමාස, සන්ධි පදවලට ය.

(4) සමාස, තද්ධිත, සන්ධි පදවලට ය.

(5) සමාස, සන්ධි, තද්ධිත පදවලට ය. (...............)

1.16. **ව්‍යාකරණානුකූල ව නොගැළපෙන** පදයක් ඇති වරණය කුමක් ද?

(1) තරම්, ඇයි, කැටුව, යළි

(2) විදේශීය, පුරාතන, ප්‍රාදේශීය, විද්‍යාඥ

(3) බලන, දුවන, ගයන, නයන

(4) ගත්කරු, ලිපිකරු, අත්අකුරු, දූකැට

(5) පුළුස්සිල්ල, පිහැටි, තර්මේන්ද්‍රිය, දෙපාකාර (...............)

1.17. **සමාසයක් නොවන පදයක්** ඇතුළත් වරණය තෝරන්න.

(1) තයිවික, ගෙළදිව, සුරපුර, බඹලොව

(2) වෙළෙඳහන්දිට, මුදුහද, පින්හාල්, දරුපෙනෙහස

(3) දියබත්, අත්වැට, රන්කම්, මල්දම්

(4) රත්මල්, සහමක්, අඹුමිරිත්, පඩිනාඩි

(5) මැසිමදුරු, අඹුසැමි, අහසපොළොව, අත්පා (...............)

1.18. **එක ම වර්ගයට අයත් නොවන පද** අන්තර්ගත වරණය තෝරන්න.

(1) අන්වර්ථ, සිරිගමාධ, පුවදැති, කවීන්ද්‍ර

(2) උපනුපන්, එයිනැත, සිහිනිග, කොකුමගරා

(3) ධනේශ්වර, ගුරුපදේශ, දැන, යෙනෙන

(4) මිදුගුණු, නොයෙක්, එබිනොබ, විරෝදාර

(5) ඇතුවත, නිරතුරු, නැණැති, ක්‍රිස්තුත්පත්තිය (...............)

1.19. ව්‍යාකරණානුකූල ව **නිවැරදි වාක්‍යය** තෝරන්න.

(1) පද පහන ඇසි රයක බල්ලෝ මුරනාව අපිට නිතර ඇසේ.

(2) කොටගමුවේ රාහුල හිමියන් කෝට්ටේ යුගයේ පඬිවරු අතර අගළින් ම වැජඹුණහ.

(3) කුමාරතුංගයන් ලියූ ව්‍යාකරණ විවරණය දැනුදු පාඨකයෝ කියවති.

(4) උපාධි අපේක්ෂකයෝ හැට දෙනෙක් නව පාඨමාලාව සඳහා තෝරා ගන්නා ලදහ.

(5) නායිමියෝ බෝමළුව අමදිති. (...............)

1.20. වඩාත් ම නිවැරදි පද බෙදීම සහිත වාක්‍යය තෝරන්න.

(1) දක්ෂ පාලකයෙකු ලෙස කටයුතු කිරීමට නම් පාලකයාට මානසික සමබරතාව තිබිය යුතුම ය.

(2) වක්‍රෝක්තිය වූ කලි කාව්‍යයේ යෙදෙන අලංකාරයන්හි පමණක් නොව කාව්‍යපුරා පවතින මුඛ්‍ය ලක්ෂණයෙකි.

(3) අනුරාධපුර යුගයේ ආර්ථික ක්‍රමය ප්‍රධාන වශයෙන් කෘෂිකර්මය හා වෙළෙඳාම මත රඳා පැවතුණ බව කිව හැකි ය.

(4) විද්‍යුත් ජනමාධ්‍ය මිනිසාගේ විනෝදාස්වාදය සඳහා මෙන්ම අධ්‍යාපනය හා සමාජයේ ඉදිරි ගමන සඳහා ද උපයෝගී කරගනු ලබන්නකි.

(5) කවියා විහරන බිය තවියාටත් සහෘදයාටත් පොදුවූ රස ජනනය කිරීමෙහි සමත් බසක් විය යුතු යි.

(...............)

(ලකුණු 20යි)

## II කොටස

(02)(අ) පහත පදහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අලංකාරවාදය දැරූ පශ්චාත්කාලීන ලේඛකයන් අතර එම විචාර සිද්ධාන්තය මහත් පරිහානියට පාත්‍ර විය. අන්තිමේ දී එය හුදෙක් කාව්‍යාලංකාර හඳුන්වා දී නිදසුන් සපයන නීරස ශාස්ත්‍රයක් බවට පත් විය. ව්‍යාකරණමය හා පියුම් තාර්කික බෙදීම් උඩ අලංකාර බෙදා හදා දැක්වීමටත් ඒ අනුව අලංකාර සංඛ්‍යාව වැඩි කර දැක්වීමටත් ඔවුන් දැරූ ප්‍රයත්නය නිසා කල් යත් ම මේ විචාර චින්තනය හුදෙක් අනම්‍ය යාන්ත්‍රික ශාස්ත්‍රයක් පමණක් විය. සමස්ත වශයෙන් බලන විට අලංකාර වාදයේ අවධානය යොමු වූයේ ක්ෂුද්‍ර අංගයන් වශයෙන් කාව්‍යාලංකාර භාවිත කිරීම කෙරෙහි පමණි. මෙයේ එමගින් කාව්‍යයෙන් ප්‍රකාශිත විෂය හා අභ්‍යන්තර හරය නොතකා එහි ආකෘතික ලක්ෂණ පමණක් පැලතිල්ලට භාජනය විය. එබඳු චින්තන ක්‍රමයක් සතුටුදායක විචාර මාර්ගයක් බවට පත්වීමට තරම් ප්‍රමාණවත් නොවන හෙයින් විචාරණය සඳහා මෙයට වඩා සතුටුදායක විචාර මාර්ගයක් සෙවීම මෙයින් අවසන් නොවී ය.

මෙයාකාර අඩුලුහුඩුකම් දක්නට ලැබුණ ද අලංකාරවාදයේ අගය කළ යුතු තැන් ද නැත්තේ නොවේ. සාහිත්‍යයේ - එනම් ශ්‍රව්‍ය කාව්‍ය සාහිත්‍යයේ - ඇති ලගන්නා සුලු බව හා අගය පිළිබඳ යථාතත්ත්වය විවරණය කිරීමට දරන ලද ප්‍රථම ප්‍රයත්න එයයි. දැනට දැනගන්නට ඇති පරිදි මෙම විචාර සිද්ධාන්තය ප්‍රථම වරට හමුවනුයේ භාමහාචාර්යන්ගේ ග්‍රන්ථය තුළින් වුව ද එය භාමහට ඉහත අවධියක සිට පැවතුණු බව නියත වශයෙන් නිගමනය කරන්නට තරම් සාධක ඇත. මෙසේ බොහෝ ඉහත කාලයක පටන් මෙම විචාර චින්තනය කවීන් හා විචාරකයන් කෙරෙහි බෙහෙවින් බලපෑ බලවේගයක් ව පැවති අතර සංස්කෘත පද්‍ය සාහිත්‍යයේ ආකෘතිය කෙසේ විය යුතු ද යන්න නියම කිරීම සම්බන්ධයෙන් එක්තරා ශක්තිමත් නියාමක බලවේගයක් වශයෙන් ද ක්‍රියා කළේ ය. අලංකාර වාදය සතු දුර්වලකම් කොතරම් තිබුණ ද එය වඩා නව්‍යතර වූත් බුද්ධිගෝචර වූත් විචාර චින්තනයන් පහළ වීමෙන් අනතුරු ව පවා ගිය මංසාවා පිටිමෙහි ලා සමත් වූයේ ය. තව ද අලංකාරවාදීහු කාව්‍යයේ සෞන්දර්යාත්මක හරය යම් පමණකට පසක් කර ගත්තෝ වූහ. ඔවුන් නොමග ගියේ එය විස්තර කිරීමට දැරූ ප්‍රයත්නයෙහි දී ය.

සංස්කෘතයේ බිහි වූ කාව්‍ය නිර්මාණ කෙරෙහි අලංකාරවාදයේ බලපෑම ඉතා පාථුල විය. මහා කාව්‍ය සම්ප්‍රදාය නමින් හැඳින්වෙන කාව්‍ය රචනා මාර්ගය සංස්කෘතයේ පුළුල් ලෙස ව්‍යාප්ත වූවකි. මෙම මහා කාව්‍ය සම්ප්‍රදාය බොහෝ දුරට අලංකාර වාදයේ ආභාසය යටතේ වැඩුණක් බව සංස්කෘත සාහිත්‍යය පිරික්සීමේ දී දක්නට ලැබේ. අලංකාරවාදීන් ස්වකීය විචාර ග්‍රන්ථවල මහා කාව්‍ය ලක්ෂණ පද්ධතිය විදහා දැක්වූවාට පසු විශ්වනාථ වැනි පශ්චාත්කාලීන විචාරකයෝ සිය ස්වකීය ග්‍රන්ථවල ඉව ප්‍රමාණයක් මහාකාව්‍ය ලක්ෂණ දැක්වීම සඳහා වෙන් කළහ.

(i) අලංකාර වාදය යාන්ත්‍රික විචාර මාර්ගයක් බවට පත් වූයේ කවර හේතු නිසා යැයි මේ ලේඛකයා පවසයි ද?

(ii) මෙහි දැක්වෙන පරිදි සතුටුදායක විචාර මාර්ගයක මූලික අවධානය යොමු විය යුත්තේ කාව්‍යයේ කවර අංග කෙරෙහි ද?

(iii) මේ පාඨයට අනුව භාමහගේ ග්‍රන්ථය ඓතිහාසික වශයෙන් වැදගත් වන්නේ කවර හෙයින් ද?

(iv) බොහෝ කාලයක පටන් කවීන් හා විචාරකයන් කෙරෙහි බල පෑ බලවේගයක් වූයේ කුමක් ද?

(v) පශ්චාත් කාලීන විචාරකයන් කෙරෙහි පවා අලංකාරවාදය බල පෑ බව සනාථ කිරීමට මේ ලේඛකයා දක්වන සාධකය කුමක් ද?

(ලකුණු 10යි)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ඇතැම් පරීක්ෂණවල දී ක්ෂේත්‍ර අධ්‍යයනය අත්‍යවශ්‍ය වෙයි. කලා අංශයට හා විද්‍යා අංශයට අයත් සමහර පර්යේෂණවල දී විශ්ව විද්‍යාලයීය පුස්තකාලය තුළ දී හෝ විද්‍යාගාරය තුළ දී එම පර්යේෂණවලට අදාළ අවශ්‍ය අධ්‍යයන කටයුතු කළ හැකි ය. එහෙත් ජනගහණය, නගර නිර්මාණය, ගමනාගමනය, කෘෂිකර්මය වැනි ඇතැම් ක්ෂේත්‍රවලට අයත් පර්යේෂණ සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය අනිවාර්යයෙන් ම කළ යුතු වෙයි. ක්ෂේත්‍ර අධ්‍යයනය යනුවෙන් බොහෝ විට හැඳින්වෙන්නේ කිසියම් පර්යේෂණයක දත්ත රැස් කිරීම හා සාමාන්‍ය නිරීක්ෂණ අවස්ථාව ය. පත්‍ය වශයෙන් හෝ ජවීර වශයෙන් දන්නා වූ ද පර්යේෂකයෙකු නිගමනයන්ට එළඹීම සඳහා ඉවහල්කර ගන්නා වූ ද කරුණු හැඟවීම පිණිස 'දත්ත' යන පාරිභාෂිකය යෙදේ. අදාළ පුද්ගලයන් හමු වීමෙන් හෝ අවස්ථාවන්ට සහභාගී වීමෙන් ද ප්‍රශ්න කරා එළඹීමෙන ද නැතහොත් තැපැල් මාර්ගික ප්‍රශ්නාවලී මඟින් පර්යේෂකයා සිය අධ්‍යයනයට අදාළ තොරතුරු එක් රැස් කරයි. ප්‍රත්‍යක්ෂයෙන් සත්‍ය යැයි දැන ගත් එබඳු කරුණු ඇසුරෙහි ඔහු නිගමනවලට බසිනුයේ.

ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා මූලික පුහුණුවක් ලබා ගත යුතු ය. නිරීක්ෂකයා තම ගවේෂණයට හසුකර ගන්නා අවස්ථාවන්ට සහභාගීවීමේ පමණට හා ඒවා හඳුරුවා ගන්නා තරමට ක්ෂේත්‍ර අධ්‍යයනය විවිධ වෙයි. සමහර පර්යේෂණයක දී තම ගවේෂණයට හසු වූ විෂයයන් හැම එකක් ගැන ම අවධානය යොමු කළ යුතු ය. ජාත්‍යා කවර වර්ගයකට අයත් පර්යේෂණයක් කර ගෙන යා යුතු ද යන්න රඳා පවතින්නේ ඔහුගේ විෂය, කාලය, බැහැරින් ලැබෙන ආධාර උපකාර හා භාවිතයට ලැබී ඇති උපකරණ යන මේවායේ ස්වරූපය මතයි. අනෙක් සාධකය තම සිය සොයා ගැනීම් පදනම් කර සාධාරණීකරණයට ඔහු කැමති වන ප්‍රමාණය ය. ප්‍රභේදක අධ්‍යන වැනි ඇතැම් පරීක්ෂණ සඳහා විවිධ වූත් වෙනස් වූත් පර්යේෂණ ක්‍රම ඇඳා ගත යුතු යි.

(ලකුණු 15යි)

(03) දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300 - 350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) තොරතුරු දැන ගැනීමේ පනත හා පුරවැසි අයිතිවාසිකම්

(ii) ජාත්‍යන්තරය හා ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව

(iii) ගුණ නැණ සිරි දරු පරපුරත් හා වැඩිහිටි පරපුරෙහි සුරක්ෂිතතාව

(iv) මාධ්‍ය නිදහස, මාධ්‍ය භාවිතය සහ ජනතාව

(v) රුපියල අවප්‍රමාණය වීම හා ශ්‍රී ලංකාවේ ආර්ථිකය

(vi) ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය හා නිරෝගී දරු පරපුරක අනාගතය

(ලකුණු 25යි)

(04)(අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) ප්‍රකට නළු නිළියෝ හිසරදයෙන් පෙළෙති' යි රූපවාහිනිය නරඹන්නෝ සිතති.

(ii) නාගරික මධ්‍යම පන්තියට අයත් ඇතැම් පවුල්වල දරුවන් සිය දෙමාපියන් ඇමතීමට 'අම්මී' 'තාත්ති' යන වචන යොදනු ලබයි.

(iii) සමහර උගත්තු විචාරශීලී බුද්ධිමතුන් නොවේ.

(iv) නිවේදකයා සිනාමුසු මුහුණින් යුතු ව සාවද්‍ය උච්චාරණයෙන් ප්‍රවෘත්ති කියවනු ලබයි.

(v) කිසියම් විෂය ක්ෂේත්‍රයක මුල් තැන ගන්නා ප්‍රවීණයන් 'සත්විති' යන පදයෙන් හඳුන්වනු ලබත්.

(ලකුණු 05යි)

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) ජගත් සංවිධානයේ බලවත් රාජ්‍යයන්හි නායකයෝ ශ්‍රී ලංකා ජනාධිපතිවරයාගේ කතාව ඇගයීමට ලක් කරති.

(ii) ප්‍රකට නවකතාකරුවකු වූ මාර්ටින් වික්‍රමසිංහ මහතා තුන්ඈඳුතු වන ගම්පෙරළිය, කලියුගය සහ යුගාන්තය ආදී බොහෝ නවකතා ලියුවේ ය.

(iii) විශේෂඥ වෛද්‍යවරියක වූ ඈ නර්තන ප්‍රසංගයක් ඉදිරිපත් කළාය.

(iv) විදුහල්පතිනිය විශේෂ කුසලතා දැක්වූ ශිෂ්‍යාවක සභාව ඉදිරියේ දී ඇගයීමට ලක් කළා ය.

(v) ජනාධිපතිතුමා අලුතින් ඉදිකරන ලද පුස්තකාලය සිසු අයිතියට පැවරුවේ ය.

(ලකුණු 05යි)

(ඉ) **නිවැරදි වාක්‍යයක්** නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) වනයේ හැසිරෙන ඇතැම් (සත්තු/ සතුන්) (මිනිස්සු/ මිනිසුන්) මෙන් ගැටුම් ඇති කරගනිති' යි ඔවුහු සිතා සිටිති.

(ii)(දැන්වීම්කරුවෝ/ දැන්වීම්කරුවන්) වෙළඳ ව්‍යාපාරිකයන්ගේ අණ (පිළිපදින්නෝ/ පිළිපදින්නන්) වෙති.

(iii)සිංහල භාෂා (ගුරුවරියක්/ ගුරුවරියක) කිහිපවරක් (මම/ මා) ඇමතුවා ය.

(iv)(ගුරුවරු/ ගුරුවරුන්) පොත්පත් කියවත් නම් ශිෂ්‍ය (ශිෂ්‍යාවන්/ ශිෂ්‍යයෝ) ද පොත්පත් කියවනු නිසැක ය.

(v) වෙළඳ (ව්‍යාපාරිකයෝ/ ව්‍යාපාරිකයන්) බොහෝ (දෙනෙක්/ දෙනෙකු) ආර්ථික ලාභය මිස සාමාජික ශුභසිද්ධිය නොසලකති.

(ලකුණු 05යි)

(05)(අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල අර්ථ විග්‍රහ කර ලියන්න.

(i) මහුගේ අරමුණෙහි **ප්‍රාප්තිය** සිදු වූයේ විසි අටවැනි වියෙහි දී වෛද්‍යවරයකු වීමෙනි.

(ii) **අද්‍යතන** ටෙලි නාට්‍යකරුවන් තේමාව ලෙස යොදා ගන්නේ මධ්‍යම ප්‍රාන්තික සමාජයේ අර්බුදකාරී අවස්ථාවන් ය.

(iii)ප්‍රකට ලේඛකයකු වූ සිරි සුමන මහතාට **අනුපස්ථිතියෙහි** දී සාහිත්‍යසූරි උපාධිය ප්‍රදානය කෙරිණි.

(ලකුණු 03යි)

(ආ) පහත දැක්වෙන තේරුම්වලට වඩාත් **සුදුසු තනි පද** ලියන්න.

(i) සමූලින් ම උදුරා දැමීම

(ii)පරම්පරාවෙන් ලැබෙන අයිතිය

(iii)පුරාණ කාලයෙහි සිට පැවතෙන

(ලකුණු 03යි)

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල **හිස්තැනට වඩාත් ම** ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් **තෝරා** ලියන්න.

(i) යමක් පිළිබඳ ව යථාර්ථය - සත්‍යය - දැකීම .............................. යි.

(ii) පාසල් සිසුන්ට සරු .............................. ගීත අසන්නට සලස්වන්නේ නම් ඔවුහු ගදෝත් දිගුකොට සවන් යොමු කොට අසන්නට සූදානමින් සිටිති.

(iii)දැනුම් කළමනාකරණය යනු තේවල කේවල සිද්ධියක් නොව සිද්ධි දාමයකින් සමන්විත ආයතනික .............................. අංග බවයි.

(iv)සංජානීය වූ කලී, අනේකවිධ සංකීර්ණතාවන්ගෙන් උපලක්ෂිත අප්‍රමාණ විෂය .............................. කි.

(v) ජාතික ඒකාබද්ධතා සංකල්පය නම් වූ උසස් .............................. සමස්ත ශ්‍රී ලාංකික පරපුරේ හදවත් තුළ පෝෂණය කිරීම සියලු සංවර්ධන ක්‍රියාවලියට මහා බලයක් වන්නේ ය.

(vi) .............................. කලා මාධ්‍ය මඟින් නිරූපණය කෙරෙන්නේ කිසියම් ජන සමාජයක පිතුම් පැතුම් ඔවුන්ගේ රසඥතාව, ශිල්පීය කුසලතාව මෙන් ම විද්‍යාත්මක හා තාක්ෂණික ඥානයන්ගේ එකතුවකි.

(සාම්ප්‍රදායික, දර්ශනය, චින්තාව, සංජානීයත, ප්‍රගාමීන, ධෛර්ය)

(ලකුණු 03යි)

(ඊ) **තද කළු අකුරෙන්** දක්වා ඇති **බහු අර්ථ** පදය **යොදා වෙනත් අරුතක් දෙන ලෙස** වාක්‍යය බැගින් තනන්න.

(i) පසළොස්වක පොහෝ දිනයේ දී **සඳ** රැස් දසත පැතිරෙයි.

(ii) සාම්ප්‍රදායික කලාකරුවා කාන්තාවන්ගේ දෙතොල **තල** දලුවලට උපමා කර ඇත.

(iii)සංදේශ කාව්‍යයන්හි දී ජයවර්ධන පුර පොහොසද **දුන** පිළිබඳ ව වර්ණනා කර ඇත.

(iv)පුතා පාසල ඇරී ගෙදර එන **තුරු** අම්මා මඟ බලා සිටියි.

(v) **වස්** කාලය අවසානයේ දී **කඨින** පිංකම් පැවැත්වේ.

(vi)ඉකුත් **වත්** දැක්වීම ජාතක කතාවන්හි වර්තමාන කතාව අවසානයේ දී සිදු වේ.

(ලකුණු 06යි)

(06) පද පෙළ අතුරෙන් දී ඇති පද කුමන ව්‍යාකරණ අංගයකට හා අනු අංගයකට අයත් දැයි දක්වන්න.

(i) මල මත පොපියන බඹර කැලස්

(ii) පුරාතන කාව්‍ය ග්‍රන්ථාවලිය මිනිසාගේ ගුණධර්ම වර්ධනය කරයි.

(iii)වීරෝදාර රණවිරුවන්ගේ සම්මාන ප්‍රදානෝත්සවය යුද හමුදා කාර්යාලයීය පරිශ්‍රයේ දී පැවැත්වේ.

(iv)විද්‍යුත් ජනමාධ්‍ය මිනිසාගේ විනෝදාස්වාදය සඳහා මෙන් ම අධ්‍යාපනය හා සමාජයේ ඉදිරි ගමන සඳහා ද උපයෝගී කර ගනු ලබන්නකි.

(v) ගුණනුවණ පිරි ළමාපරපුරක් බිහිකිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ එක් ප්‍රමුඛ කාර්යයකි.

(1/2 × 6 = ලකුණු 15යි)

(07)(අ) පහත දැක්වෙන යෙදුම්වලට වචනක් ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) නැති වූ දෙයෙහි අගය වැඩි යයි සිතීම.

(ii) හොඳ මිනිසුන් අතර නරක මිනිස්සු ද සිටිති.

(iii)යහපත් දෙදෙනකු එකතු වීම.

(iv)මහලු වියේ දී තරුණ පිල් රකිති.

(v) උගුඩුවා ඇටි කෙහෙල් කෑවා වගේ.

(vi)පුළු කෙනෙකුගේ උපකාරයක් ලැබ බලවත් කෙනෙකුට ප්‍රශංසා කිරීම (ලකුණු 03යි)

(ආ) පහත දී ඇති රූපිවල අදහස පැහැදිලි වන සේ වාක්‍යවල යොදන්න.

| | |
|---|---|
| (i) උරවකුමාලාවත් | (ii) අං ඇවිල්ලා |
| (iii)දිවෙන් දිව ගාගෙන | (iv) පායම ගියා |
| (v) ඇඟට පල් ඉනුවා | (vi) වටුල් වක |

(ලකුණු 03යි)

(ඉ) පහත දී ඇති එක් එක් යුගල පද කැඳී ඇති රටාව කුමක් දැයි දක්වන්න.

| | |
|---|---|
| (i) උදවු - උපකාර | (ii) රෙදි - පෙරෙදි |
| (iii)වංහුං | (iv) ගොඩ - මඩ |
| (v) සොයා - බලා | (vi) ඇඳුම් - ආයින්තම් |

(ලකුණු 03යි)

(ඊ) පහත දී ඇති ප්‍රාදේශීය ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද ලියා දක්වන්න.

| | |
|---|---|
| (i) කිරීකට හේලය | (ii) වතුම්පොත |
| (iii)අපක්කුවෙන් | (iv) පාරපුමාවට |
| (v) බාපත | (vi) පුනංගුව |

(ලකුණු 03යි)

(උ) පහත දී ඇති ප්‍රාප්‍යාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත් ලියන්න.

| | |
|---|---|
| (i) තෙවෙත්තුව | (ii) අත්තම |
| (iii)අසනාපි වීම | (iv) දියලබ්බ |
| (v) වඩිදිය | (vi) ඉත්තියර |

(ලකුණු 03යි)

(08) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

උගතයුත්තක්වශයෙන්භාෂාවෙහිදඅන්තර්ගතයක්ඇතිබවත්වහරෙහිසදොස්නිදොස්උචිතඅනුචිතලසස්පහස්පවතිනබවත්පිළිගතමනායේඅතුරින්නිදොස්වූත්උචිතවූත්ලසස්වූත්ලක්ෂණසියවහරෙහියොදන්නෝනමනටඇවසිනිරවුල්වූත්අසවත්වූත්බලවත්වූත්භාෂාරීතියක්නිෂ්පාදනයකරගනිතිසිංහලයලසස්සංස්කෘතියෙකවාහකයබවටපත්වූයේමෙයටදෙදහස්වසරකටදපරයවිෂයයකවරෙක්වේවාප්පිළිබඳඅදහස්ප්‍රකාශකිරීමේමාධ්‍යයක්වශයෙන්කවරාවුවසිංහලයදුබලභාවක්නොදැක්වියදැනුදුනොදක්වයිවාක්කෝෂයඑහිලාප්‍රමාණවත්ය.

(i) ඉහත ඡේදය ශාස්ත්‍රීය යැයි බොහෝ දෙනෙකු විසින් ම පිළිගත් ක්‍රමය අනුව පද බෙදා විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(ii) රකාරාංශය සහිත පද දෙකක් ඡේදයෙන් උපුටා දක්වන්න.

(iii)ඡේදයේ සඳහන් ගැට ඇලපිල්ල, යංශය අන්තර්ගත වචන දෙකක් ලියා දක්වන්න.

(iv)ඡේදයේ ඇති "අනුචිත" යන පදයෙහි ඇතුළත් පිල්ලම් නම් කරන්න.

(v) රකාරාංශය හා රේඵය අන්තර්ගත ඔබ දන්නා පදයක් ලියන්න.

(ලකුණු 15යි)

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 13 ශ්‍රේණිය.
පළමු වාර පරීක්ෂණය - 2018 - නොවැම්බර්
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 ஜூலை, தரம் 13 முதலாம் தவணைப் பரீட்சை
General Certificate of Education (Adv. Level) Grade 13 First Term Test 2018 November

සිංහල - පිළිතුරු පත්‍රය
Sinhala Answer Sheet

71 S I

01)

(අ)(i) බුදුන්ගේ බුදුරැස් බිත්තියට වැදීමෙන්

(ii) දන්දීමට හා බණ ඇසීමට පෙළැඹීමෙන්

(iii) උපමාව :- කප් ගිනිගත් රුවන් ගෙමරක් - රෙදි පටින ඇඳි බුද්ධ රූපයක්
උපමේය :- බුදුරැස් - බුදුරැස්

(iv) අසූවක් වන කුඩා ප්‍රමාණයේ ශරීර ලක්ෂණ (දෙතිස් මහා පුරුෂ ලක්ෂණවලට අනුකූලව පිහිටා ඇත.)
බඹයක් (මීටර 2ක්) තරම් දුරට බුදු සිරුරෙන් විහිදෙන රශ්මි වළල්ල

(ලකුණු 04 යි)

(ආ) (i) මස් උපදින්නේ කොහෙන්දැ යි යන පැනයෙන්

(ii) මස් උපදින්නේ මවපාලින් යන අදහස

(iii) අනුරුද්ධ කුමාරයා

(iv) මවපාලින් - භාණ්ඩ ශාලාව/ වී බිස්ස
වඩුරියන - වඩුවන් දැව මනින ඒකකය/ අඟල් 18 කි

(ලකුණු 04 යි)

(ඇ)(i) කසාය වස්ත්‍රයක් හැඳ පොරවාගෙන පැමිණෙන ලෙස

(ii) බිසිල් රජ්ජුරුවන්ට / සුද්ධෝදන රජතුමාට

(iii) එක පැහැර බුදුන් පාමුල් හි අඬා වැටීම

(iv) උභයකුලපරිශුද්ධ - මවගේ පියාගේ දෙපාර්ශවයෙන් ම පිරිසිදු වූ

(ලකුණු 04 යි)

(ඈ)(i) දිව්‍ය කාන්තාවන් පරදන ලෙසින්

(ii) උදේනිපුර සියලු ම මිනිසුන්

(iii) මහා බ්‍රහ්මයාගේ සිත

(iv) ක්‍රීඩා - කෙළි
දෙවියන් - සුර

(ලකුණු 04 යි)

(ඉ)

(i) ඇරව්වල නන්දිමිත්‍ර මහතාගේ "නංගී" කෙටිකතා සංග්‍රහයේ සඳහන් "නංගී" කෙටිකතාවෙන් උපුටා ගැනුණකි.

ජිනසේන කම තැගණිය වන දයානිගේ කොළඹ නිවසට ගොස් සිටි අවස්ථාවේ ජිනසේන විසින් දයානිගේ දුව වන පුතාට මෙසේ ප්‍රකාශ කරන ලදී.

(ii) කෝට්ටේ යුගයේ වැත්තෑවේ හිමියන් විසින් රචිත ගුත්තිල කාව්‍යයෙන් උපුටා ගැනුණකි. බරණැස්පුර සිට උදේනිපුරට වෙළඳාමේ ගිය වෙළෙන්දාට මිහිරි වීණා නාදයක් ඇසීමේ අරමුණින් සුදුසු වීණා වාදකයෙකු සොයා දෙන්නැ යි වෙළෙන්දන් විසින් උදේනිපුර වැසියන්ට කියන ලදී.

(iii) දඹදෙණි යුගයේ ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්මරත්නාවලියේ මට්ටකුණ්ඩලී කතා වස්තුවෙන් උපුටාගෙන ඇත. මට්ටකුණ්ඩලී මිය පරලොව ගියාට පසුව අදින්න පුබ්බක පොහොයත් අවමින් සිටින මොහොතේ මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා මුණගැසුණු අවස්ථාවේ අදින්නපුබ්බක විසින් මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයාට මෙසේ පවසන ලදී.

(iv) කේ. ජයතිලක මහතාගේ 'නොනිමි සිත්තම හා තවත් කෙටිකතා' සංග්‍රහයේ එන නොනිමි සිත්තම කෙටිකතාවෙන් උපුටා ගැනුණකි. මෙහි අසංගගේ බිරිඳගේ චිත්‍රයක් අසංගගේ කාර්යාලයේ සේවිකාවක වන ශීලා දැක් ඒ ගැන අසංගට අදහස් දැක්වීමේ දී ශීලා විසින් මෙසේ ප්‍රකාශ කරන ලදී.

(v) කුරුණෑගල යුගයේ රචිත පන්සියපනස් ජාතක පොතෙහි 477වෙනි ජාතකය වන චන්දකින්නර ජාතකයේ සඳහන් පාඨයකි. ලිය කිඳුරා සහ කිඳුරිය නටමින් සිටි අවස්ථාවේ බරණැස් රජු කිඳුරිය පිළිබඳ සිතකින් කිඳුරාට එල්ල කළ ඊ තලයෙන් තුවාල වූ කිඳුරා වේදනාවෙන් කිඳුරිය අමතා මෙසේ ප්‍රකාශ කළේ ය.

(vi) ගුණදාස අමරසේකර මහතා විසින් රචිත "එක්ටැම්ගේ පොළොවට" කෙටිකතා සංග්‍රහයේ සඳහන් දිසොන්චිනා හාමි කෙටිකතාවෙන් උපුටාගත් පාඨයකි. දිසොන්චිනාහාමිගේ මරණය පිළිබඳ දැනගත් ඇගේ ස්වාමිපුරුෂයා රෝහලට පැමිණි මොහොතේ රෝහල් සේවක බන්දුසේන මහතා ඔහුගේ සිත සැනසීමට අදහස් ප්‍රකාශ කළේ ය. ඒ අවස්ථාවේ දිසොන්චිනා හාමිගේ ස්වාමිපුරුෂයා විසින් බන්දුසේනට කරන ලද ප්‍රකාශයකි.

(ලකුණු 08 යි)

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Receved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 13 ශ්‍රේණිය.
පළමු වාර පරීක්ෂණය - 2018 - නොවැම්බර්
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 ஜூலை, தரம் 13 முதலாம் தவணைப் பரீட்சை
General Certificate of Education (Adv. Level) Grade 13 First Term Test 2018 November

සිංහල - පිළිතුරු පත්‍රය
Sinhala Answer Sheet

71 | S | II

## I - කොටස

01)

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1.1 | (3) | 1.6 | (3) | 1.11 | (3) | 1.16 | (3) |
| 1.2 | (5) | 1.7 | (2) | 1.12 | (4) | 1.17 | (4) |
| 1.3 | (1) | 1.8 | (1) | 1.13 | (2) | 1.18 | (2) |
| 1.4 | (2) | 1.9 | (3) | 1.14 | (1) | 1.19 | (4) |
| 1.5 | (4) | 1.10 | (5) | 1.15 | (5) | 1.20 | (1) |

## II - කොටස

(ලකුණු 20යි)

(02)(අ)

(i) ව්‍යාකරණමය හා සිඳුම් තාර්කික බෙදීම් ලෙස අලංකාර සංඛ්‍යාව වැඩිකර දැක්වීමත් නිසා

(ii) කාව්‍යයෙන් ප්‍රකාශිත විෂය හා අභ්‍යන්තර හරය කෙරෙහි

(iii) ශ්‍රව්‍ය කාව්‍ය සාහිත්‍යයේ ඇති ලඟන්නා සුලු බව හා අගය පිළිබඳ යථා තත්ත්වය මනෝවිද්‍යාත්මක වශයෙන් විවරණය කිරීමට දැරූ ප්‍රථම ප්‍රයත්නය වීම නිසා

(iv) අලංකාර වාදය

(v) මහා කාව්‍ය ලක්ෂණ දැක්වීම

(ලකුණු 10යි)

(ආ)

1. ක්ෂේත්‍ර අධ්‍යයනය හා ක්ෂේත්‍ර නොවන අධ්‍යයනය වශයෙන් පර්යේෂණවල දී අනුගමනය කෙරෙන අධ්‍යයන ක්‍රම දෙකක් ඇති බව
2. ඇතැම් පර්යේෂණ සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය අනිවාර්ය බව
3. ක්ෂේත්‍ර අධ්‍යයනයේ අවස්ථා: දත්ත රැස්කිරීම, සාමාන්‍ය නිරීක්ෂණය
4. දත්ත හා ඒවා රැස් කරන විදි හැඳින්වීම
5. ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා මූලික පුහුණුවක් අවශ්‍ය බව, එහි විවිධත්වය හා විශේෂතා (ලකුණු 15යි)

(03) වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

i. රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය

ii. එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම

iii. කරුණුවල පැහැදිලි බව

iv. නිවැරදි අක්ෂර වින්‍යාසය

v. ව්‍යාකරණ දෝෂ රහිත වීම

vi. භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම

vii. සුදුසු ලෙස ඡේද වෙන් කිරීම

viii. කියවිය හැකි සේ අත් අකුරු පැහැදිලි වීම

ix. විවිධ භාෂෝචිත ප්‍රයෝග භාවිතය (උපමා, රූපක, ආර්ථෝපදේශ, ප්‍රස්තාව පිරුළු)

(ලකුණු 25යි)

(04)(අ)

(i) පුදුකට තරු නිළියන් හිසරදයෙන් පෙළෙති' යි රූපවාහිනිය නරඹන්නෝ සිතති.

(ii) නාගරික මධ්‍යම පන්තියට අයත් ඇතැම් පවුල්වල දරුවෝ සිය දෙමාපියන් ඇමතීමට 'අම්මි' 'තාත්ති' යන වචන යොදති./ නාගරික මධ්‍යම පන්තියට අයත් ඇතැම් පවුල්වල දරුවන් විසින් සිය දෙමාපියන් ඇමතීමට 'අම්මි' 'තාත්ති' යන වචන යොදනු ලබයි./ ලැබේ.

(iii) සමහර උගත්තු විචාරශීලී බුද්ධිමත්තු නොවෙති.

(iv) නිවේදකයා සිනාමුසු මුහුණින් යුතු ව සාවද්‍ය උච්චාරණයෙන් ප්‍රවෘත්ති කියවයි./ නිවේදකයා විසින් සිනාමුසු මුහුණින් යුතු ව සාවද්‍ය උච්චාරණයෙන් ප්‍රවෘත්ති කියවනු ලබයි./ කියවනු ලැබේ./ කියවෙයි.

(v) කිසියම් විෂය ක්ෂේත්‍රයක මුල් තැන ගන්නා පුද්ගලයෝ 'සත්විසි' යන පදයෙන් හඳුන්වනු ලබත්/ හැඳින්වෙත්.

(ලකුණු 05යි)

(ආ)

(i) ජගත් සංවිධානයේ බලවත් රාජ්‍යයන්හි නායකයන් විසින් ශ්‍රී ලංකා ජනාධිපතිවරයාගේ කතාව ඇසීමට ලක් කෙරේ/ කෙරෙයි/ කරනු ලැබේ/ කරනු ලබයි

(ii) ප්‍රකට නවකතාකරුවකු වූ මාර්ටින් වික්‍රමසිංහ මහතා විසින් තුන් ඈඳුතු වන ගම්පෙරළිය, කලියුගය සහ යුගාන්තය ආදී බොහෝ නවකතා ලියන ලදි/ ලියැවිණි.

(iii) විශේෂඥ වෛද්‍යවරියක වූ ඇය විසින් නර්තන ප්‍රසංගයක් ඉදිරිපත් කරන ලදි/ කෙරිණි.

(iv) විදුහල්පතිනිය විසින් විශේෂ කුසලතා දැක්වූ ශිෂ්‍යාවන් සභාව ඉදිරියේ දී ඇගයීමට ලක් කරන ලද්දී ය/ කරනු ලැබුවා ය.

(v) ජනාධිපතිතුමා විසින් අලුතින් ඉදිකරන ලද පුස්තකාලය සිසු අයිතියට පවරන ලදි/ පැවරිණි. (ලකුණු 05යි)

(ඉ)

(i) වනයේ හැසිරෙන ඇතැම් සතුන් මිනිසුන් මෙන් ගැටුම් ඇති කර ගනිති' යි ඔවුහු සිතා සිටිති.

(ii) දැන්වීම්කරුවෝ වෙළඳ ව්‍යාපාරිකයන්ගේ අණ පිළිපදින්නෝ වෙති.

(iii) සිංහල භාෂා ගුරුවරියක් කිහිපවරක් මා ඇමතුවා ය.

(iv) ගුරුවරු පොත්පත් කියවත් නම් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද පොත්පත් කියවනු නියත ය.

(v) වෙළඳ ව්‍යාපාරිකයෝ බොහෝ දෙනෙක් ආර්ථික ලාභය මිස සාමාජීය ශුභසිද්ධිය නොසලකති. (ලකුණු 05යි)

(05)(අ)

(i) ප්‍රාප්තාර්ථිය - මුදුන් පත් වීම්/ බලාපොරොත්තු ඉටුවීම/ අරමුණ ඉටුවීම/ අපේක්ෂාව සඵල වීම (ලකුණු 15යි)

(ii) අද්‍යතන - වර්තමාන/ නූතන

(iii) අනුපපත්තිසෙහි - ඉදිරියෙහි නොමැති (අන් + උපපත්ති) (ලකුණු 03යි)

(ආ)
(i) සහමුලින් ම උදුරා දැමීම - මුලෝත්පාටනය

(ii) පරම්පරාවෙන් ලැබෙන අයිතිය - ප්‍රවේණිය

(iii) පුරාණ කාලයෙහි සිට පැවතෙන - චිරන්තන

(ලකුණු 03යි)

(ඇ)
(i) දර්ශනයකි (ii) පුනාවිත (iii) සංස්කෘතිකයා

(iv) පරය (v) විත්තාව (vi) සාම්ප්‍රදායික

(ලකුණු 03යි)

(ඈ)
(i) සඳ : උතුම්/ පූර්ණ/ කල්කි/ කාන්තාව

(ii) නා : නයා/ නොපැමිණි/ මූලන්/ ප්‍රධාන/ හෘදය/ ඇතා/ නොයෙක්

(iii) දන : ජලය/ ධනය/ දානය/ දනවා

(iv) තුරු : ගස/ තරු/ සෙත්/ අසුර/ තූර්ය

(v) වස් : වර්ෂය/ වස/ වංශය/ වස් දවුව/ විසීම

(vi) වත් : වෘතය/ වස්තුව/ මුහුණ/ ශරීරය/ වස්ත්‍රය/ ධනය/ කතාව

(ලකුණු 06යි)

(06)
(i) නිපාත, කෘදන්ත, සමාස(සම්බන්ධ විභක්ති සමාසය)/ සමූහාර්ථ

(ii) තද්ධිත, සන්ධි/ සමාස, සමාස

(iii) විභක්ති, සන්ධි, සන්ධි

(iv) සමාස, සන්ධි, සන්ධි

(v) (ද්‍රව්‍යාර්ථ) සමාස, (විශේෂණ) සමාස, සන්ධි

(ලකුණු 15යි)

(07)(අ)
(i) හිස පුළා මිහ රකා

(ii) හඳුන් වගෙන් ඇග උරුලැවේ

(iii) සඳුන් ගහට සමන් වැල ගියා වගේ

(iv) නාකි වුණාම ගෙත් කපේ රකී

(v) කණ්හාව නිසා කරදරයට පත්වීම

(vi) ගඟෙන් දිය බී මුහුදට ආවඩන්නා සේ

(ලකුණු 03යි)

(ආ)
(i) අනවශ්‍ය කරදරයක් (ii) අහංකාර වෙලා

(iii) දැඩි මිතුරු කමින් (iv) කීර්තිය/ නම්බුව නැතිවීම

(v) අවදානම් අනතුරකින් ගැලවීම (vi) ස්ථිර ප්‍රතිපත්තියක් නැති වීම

නියමිත වචනය ලියා ඇති විට අදහස ප්‍රකට වේ නම් ලකුණු දෙන්න

(ලකුණු 03යි)

(ඉ)
(i) අර්ථයෙන් සමාන පද දෙකක් එක්වීමෙන්

(ii) මුල් පදය අර්ථයක් ඇති නමුත් අනෙක් පදයෙහි අර්ථයක් නැත

(iii) පද දෙකෙහි ම අර්ථයක් නැත

(iv) විරුද්ධ පද දෙකක් එකට යෙදීම

(v) පූර්ව ක්‍රියා පද එක් වීමෙන්

(vi) සමානාර්ථ/ එකම වර්ගයට අයත් පද එක් වීමෙන්

(ලකුණු 03යි)

(ඊ)
(i) මනමාලයා නැන්දම්මාට දෙන රෙදි කට්ටලය

(ii) හතැරින් පත් වට්ටිය

(iii) තදිසියෙන්

(iv) පිළිවෙළට/ සිහි කල්පනා ඇති ව

(v) උළුවස්ස

(vi) ප්‍රමාදය

(ලකුණු 03යි)

(උ)
(i) විධාව/ වෙහෙස

(ii) උදව්වට වැඩ කිරීම

(iii) විනාශවීම

(iv) වතුර ගෙන යන ලබු කැටය

(v) මුහුදු දිය වැටීම

(vi) සීමා නියර

(ලකුණු 03යි)

(08)
(i) උගත යුත්තක් වශයෙන් භාෂාවෙහි ද අන්තර්ගතයක් ඇති බවත් වහරෙහි සදොස්- නිදොස්, උචිත- අනුචිත, උසස්-පහත්,පවතින බවත් පිළිගත මනා ය. ඒ අතුරින් නිදොස් වූත් උචිත වූත් උසස් වූත් ලක්ෂණ පිය වහරෙහි යොදන්නෝ තමනට ඇවසි නිරවුල් වූත් රසවත් වූත් බලවත් වූත් භාෂා රීතියක් නිෂ්පාදනය කර ගනිති.

සිංහලය උසස් සංස්කෘතියෙක වාහකය බවට පත් වූයේ මෙයට දෙදහස් වසරකට ද පෙර ය. විෂය කවරක් වේවා ඒ පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමේ මාධ්‍යයක් වශයෙන් කවර දා වුව සිංහලය දුබලතාවක් නො දැක්වී ය. දැක්වූ නො දක්වයි. වාක්කෝෂය එහි ලා ප්‍රමාණවත් ය.

පද බෙදීම (ලකුණු 03යි)

විරාම ලක්ෂණ (ලකුණු 04යි)

(ii) ප්‍රකාශ, ප්‍රමාණවත්

(iii) සංස්කෘතියෙක, මාධ්‍යයක

(iv) පාපිල්ල, ඉස්පිල්ල

(v) ප්‍රදර්ශනය, ප්‍රහර්ෂ, ප්‍රවර්ධනය (රේඵය ඇතිව)

(ලකුණු 08යි)


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440